Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2025**

INSERT **1 hour 30 minutes**

**INFORMATION**
- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages.


© UCLES 2025
[Turn over

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–14** on the Question Paper.

ශ්‍රී ලංකාව තිබෙන්නේ ලොව තේ නිපදවන රටවල් අතරින් තුන්වැනි ස්ථානයේ ය. තේ ශ්‍රී ලංකාවේ ප්‍රධානම අපනයනයකි. එබැවින් එය ශ්‍රී ලංකාවට විදේශ විනිමය ගෙන එන ප්‍රධානම මාගර්යක් ද වේ. ශ්‍රී ලංකා තේ ලෝක ප්‍රසිද්ධ වන්නේ එහි ඇති රසයත් ඉහල ගුණාත්මක තත්වයත් නිසා ය.

ශ්‍රී ලංකාවට තේ කර්මාන්තය හඳුන්වා දී තිබෙන්නේ බ්‍රිතාන්‍යයන් විසින් 1824 දී පමණය. ඔවුන් විසින් චීනයෙන් ගෙන එන ලද ප්‍රථම තේ පැලැටිය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ රෝපණය කර ඇත්තේ එම වසරේදී ය. ශ්‍රී ලංකාවේ කඳුකර ප්‍රදේශවල තිබෙන දේශගුණික තත්වයන් තේ වගාවට ඉතා උචිත බව නිගමනය කිරීම මෙකී තේ හඳුන්වා දීමට හේතු විය.

ස්කොට්ලන්ත ජාතික වැවිලිකරුවෙකු වූ ජේම්ස් ටේලර් මහතා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ පියා ලෙස සලකනු ලබයි. වර්ෂ 1852 දී ශ්‍රී ලංකාවට පැමිණි ඔහු විසින් තේ වගාව කර්මාන්තයක් ලෙස ආරම්භ කලේය. අක්කර 19ක තරම් කුඩා තේ වත්තකින් ඔහු විසින් සිය වගාව ආරම්භ කල අතර, එහි සාර්ථකබව හේතුවෙන් ඉතා ඉක්මනින් එය වගා කර්මාන්තයක් ලෙස පැතිර ගියේය. මෙම තේ ලන්ඩන් තේ වෙන්දේසියේදී ඉතා ඉහල ඇගැයුමකට ලක් විය. මෙලෙස තේ වගාව ඉතා ඉක්මනින් ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූ අතර මේ හේතුව නිසාම වසර 1883 සිට කොළඹ තේ වෙන්දේසිය ආරම්භ විය. ශ්‍රී ලංකාවේ තේ සඳහා “සිලෝන් ටී” යන සන්නාමය ලැබුණි. මේ සියලු කරුණු සඳහා හේතු වූයේ ශ්‍රී ලංකාවේ තේවල ඇති විශිෂ්ට රසයත්, විවිධ දේශගුණික තත්වයන් ඇති ශ්‍රී ලංකාවේ විවිධ තේ වර්ග නිෂ්පාදනය කිරීමට ඇති හැකියාවත් ය.

තේ කර්මාන්තය ශ්‍රී ලංකාව තුල මුලින්ම කරන ලද්දේ බ්‍රිතාන්‍ය වැවිලිකරුවන් සහ යුරෝපීය සමාගම් විසිනි. මේ නිෂ්පාදන තේ වෙන්දේසි ඔස්සේ යුරෝපයට යැවීමට කටයුතු කරන ලද්දේ යුරෝපීයයන් ශ්‍රී ලංකාවේ ප්‍රධානම තේ ගැනුම්කරුවන් වශයෙනි. වර්ෂ 1948 දී ශ්‍රී ලංකාව යටත් විජිත බවින් බ්‍රිතාන්‍යයෙන් නිදහස ලැබූ පසු එහි ප්‍රතිඵලයක් ලෙස 1960 දී බ්‍රිතාන්‍යයන් සතුව තිබූ තේ වතු රජයට පවරා ගන්නා ලදී. කෙසේ වුවත් වසර 1971 පමණ වනතුරු ශ්‍රී ලංකාවේ බොහෝ තේ ව්‍යාපාරිකයන් බ්‍රිතාන්‍යයන් විය.

ශ්‍රී ලංකාවේ තේ වගාව හේතුවෙන් වර්ධනය වූයේ තේ කර්මාන්තය පමණක් නොවේ. ශ්‍රී ලංකාව තුල මනා වූ පාලම් ආදියෙන් සමන්විත සැලසුම් කල ප්‍රවාහන හා මහා මාර්ග පද්ධතියත්, දුම්රිය ප්‍රවාහන පහසුකම් ඇති කිරීමත්, රථවාහන ආනයනය කිරීමත්, තේ කර්මාන්තයට අදාල නව විෂයයක් මෙන්ම ඒ සඳහා වෙනම ශ්‍රමික පිරිසක් ඇති වීමත්, ඒ පිලිබඳ විශේෂඥ පිරිසක් බිහිවීමත් මේ හා බැඳුණු නව ව්‍යාප්තීන් විය.

මෙලෙස ආරම්භ වී ව්‍යාප්ත වූ ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය පසු කලක දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග තුනෙන් එකක් විය. අනෙක් අපනයන භෝග වූයේ රබර් සහ පොල් වගාවන්ය.

අද තේ වගාව ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරය වසා පැතිර ඇති ප්‍රධානම භෝගය බවට පත් වී ඇත. එහෙත් ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය කරන්නේ කඳුකර ප්‍රදේශවල පමණක් නොවන අතර පහළ මධ්‍යම හෙවත් මැදරට සහ පහතරට ප්‍රදේශවලද තේ වගාව සිදු කරන්නේ ඒ තේ සඳහා වෙනම රසයක් ද ගෙන දෙමින් ය. ලොව සමහර රටවල්වලින් ශ්‍රී ලංකාවේ මැදරට මෙන්ම පහතරට තේ සඳහා ද වෙනම ඉල්ලුමක් ඇත.

තේ කර්මාන්තය පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණ ආයතන, මෙම විෂයට අදාළ අධ්‍යාපන ආයතන මෙන්ම තේ සම්බන්ධ කෞතුකාගාර ද ඇතිවී තිබේ. තේ නිෂ්පාදනය මෙන්ම තේ පානය ද සංස්කෘතියක් බවට පත්ව ඇත.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of Cambridge Assessment. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is a department of the University of Cambridge.

© UCLES 2025